## B කොටස - රචනා

### ප්‍රශ්න දෙකකට පමණක් පිළිතුරු සපයන්න

05)

a) උෂ්ණත්වය කෙල්වින් T හිදී රේචනය කරන ලද සංවෘත දෘඪ භාජනයක් තුලට Z නමැති ඝණයක් හා A නැමැති වායුවෙන් 2.4 mol ක් ඇතුළු කරයි. එවිට එහි පීඩනය $4 \times 10^5$ Pa විය. පද්ධතිය කෙල්වින් 2T දක්වා ඉහළ නැංවූ විට Z ඝණය ද සම්පූර්ණයෙන්ම වායු බවට පත්වූ අතර මෙම උෂ්ණත්වයෙදී පහත සමතුලිතය ඇති විය . (ඝණයේ පරිමාව භාජනයේ පරිමාව සමග නොසලකා හරින්න )

$$A(g) + Z(g) \rightleftharpoons C(g) + 2D(g)$$

සමතුලිත පද්ධතියේ A හි ආංශික පීඩනය $6 \times 10^5$ Pa ද Z හි ආංශික පීඩනය $4 \times 10^5$ Pa වන බව සොයාගෙන ඇත

I. 2T k උෂ්ණත්වයෙදී C හා D හි ආංශික පීඩන සොයන්න .

II. 2T k උෂ්ණත්වයේදී සමතුලිත පද්ධතියේ $K_P$ අගය සොයන්න .

III. T k උෂ්ණත්වයේදී පද්ධතියට ආරම්භයේදී දැමූ Z මවුල ගණන සොයන්න

IV. 2T k උෂ්ණත්වයේ පවතින සමතුලිත පද්ධතිය ක්ෂණිකව T k දක්වා අඩු කල විට Z ට අමතරව D ද ඝණ තත්වයට පත්වූ අතර එම ඝණ ද්‍රව්‍ය සියල්ල පද්ධතියෙන් ඉවත් කර ගනී.

   i. ඉවත්කරගත හැකි D මවුල ගණන සොයන්න

   ii. පද්ධතියේ නව පීඩනය සොයන්න .

V. ඉහත I හි ආරම්භක පද්ධතිය 2.2 T k දක්වා වැඩි කර නැවත පද්ධතිය ක්ෂණිකව T k දක්වා උෂ්ණත්වය අඩු කළ විට වෙන්කරගත හැකි D මවුල ගණන 1.5 mol ක් නම් $A(g) + Z(g) \rightleftharpoons C(g) + 2D(g)$ යන සමතුලිතයේ ඉදිරි ප්‍රතික්‍රියාව තාප දායකද, තාප අවශෝෂකද යන්න පැහැදිලි කරන්න .

b) $Co^{3+}$ කැටායනය ජලයේදී X නමැති උදාසීන ලිගනය සමග $[Co(X)_n]^{3+}$ ආකාරයේ සංගත සංකීර්ණයක් සාදයි එහි n හි අගය සොයාගැනීමට භාවිත කල පියවර දෙකක තොරතුරු පහත දැක්වේ .

**පියවර 01**

සාන්ද්‍රණය 2.45 $mol\,dm^{-3}$ වන X අඩංගු ජලීය ද්‍රාවණයක 40 $cm^3$ කට $CHCl_3$ 20 $cm^3$ ක් දමා හොඳින් සොලවා පැහැදිලි ලෙස ස්ථර වෙන්වූ පසු , ජලීය ස්ථරයෙන් 10.00 $cm^3$ ක් වෙන් කරගෙන සාන්ද්‍රණය 2.00 $mol\,dm^{-3}$ වන HA අම්ලය සමග අනුමාපනය කල විට වැයවූ අම්ල පරිමාව 12.00 $cm^3$ ක් විය .

$$HA + X \longrightarrow XHA$$

I. ජලය සහ $CHCl_3$ එකිනෙකට මිශ්‍ර නොවන අතර X එකම අණුක ආකාරයෙන් එම කලාප දෙකෙහිම දියවේ.

   i. ජලය සහ $CHCl_3$ අතර X හි ව්‍යාප්ත සංගුණකය ($K_D$) සඳහා ප්‍රකාශය ලියා දක්වන්න .

   ii. ජලීය ස්ථරයෙන් 40 $cm^3$ ක X මවුල ගණන සොයන්න

   iii. $CHCl_3$ ස්ථරයෙන් 20 $cm^3$ ක X මවුල ගණන සොයන්න

   iv. ජලය සහ $CHCl_3$ අතර ව්‍යාප්ත සංගුණකය ($K_D$) අගය සොයන්න

23' AL API [ PAPERS GRO

**පියවර 02**

X හි සාන්ද්‍රණය 1.10 $mol\,dm^{-3}$ වන ජලීය ද්‍රාවණයක 20 $cm^3$ ක් $CO^{3+}$ හි සාන්ද්‍රණය 0.02 $mol\,dm^{-3}$ වන ජලීය ද්‍රාවණයක 20 $cm^3$ සමග මිශ්‍ර කර එයට $CHCl_3$ 20 $cm^3$ ක් දමා හොඳින් සොලවා පැහැදිලි ලෙස ස්ථර වෙන්වූ පසු $CHCl_3$ ස්ථරයේ 20 $cm^3$ වෙන්කර සාන්ද්‍රණය 0.02 $mol\,dm^{-3}$ වන HA අම්ලය සමග අනුමාපනය කල විට වැයවූ අම්ල පරිමාව 20.00 $cm^3$ ක් විය . $Co^{3+}$ කැටායනය ජලීය කලාපයේ පමණක් ඇත.

CamScanner

II. i. $CHCl_3$ ස්ථරයේ X මවුල ගණන සොයන්න.

ii. ජලීය ස්ථරයේ නිදහස් X මවුල ගණන සොයන්න.

iii. $Co^{3+}$ සමග සංකීර්ණයට දායක වූ X මවුල සොයන්න.

iv. $[CO(X)_n]^{3+}$ සංකීර්ණයෙහි n අගය සොයන්න.

06) a) අහාර ජීරණ පද්ධතියේ අහිතකර බැක්ටීරියා ඉවත් කිරීමේ ඖෂධ නිපදවීමේදී Alkaline Phospatase නැමති එන්සයිමය වැදගත් වේ . මෙම එන්සයිමයේ ක්‍රියාකාරිත්වය පෙන්වන $P^H$ පරාසය හඳුනාගැනීම සඳහා සාදාගත් 200 $cm^3$ ක් වන A මිශ්‍රණයේ තොරතුරු පහත දැක්වේ .

25$C^0$ දී 200 $cm^3$ වන A මිශ්‍රණයේ $NH_3$ හි සාන්ද්‍රණය 0.2 $moldm^{-3}$ ක් වන අතර $NH_4Cl$ හි සාන්ද්‍රණය 0.3 $moldm^{-3}$ වේ. $K_{b\,(NH3)} = 1.8 \times 10^{-5}$ $moldm^{-3}$ .

(I) i. A මිශ්‍රණයේදී එන්සයිමයේ ක්‍රියාකාරිත්වය ආරම්භ වේ නම් A මිශ්‍රණයේ ආරම්භක $P^H$ අගය සොයන්න .

ii. A මිශ්‍රණයේ 100 $cm^3$ ක් වෙන්කරගෙන එයට NaOH 1g ක් එක්කල විට එන්සයිමය එහි උපරිම ක්‍රියාකාරිත්වයක් පෙන්වා අක්‍රිය වේ නම් එන්සයිමය අක්‍රිය වන $P^H$ අගය සොයන්න.

iii. එන්සයිමයේ ක්‍රියාකාරී $P^H$ පරාසය සොයන්න .

iv. ඉහත ආරම්භක A මිශ්‍රණයට ජලය ස්වල්පයක් එක්කල විට $P^H$ අගයේ සැලකිය යුතු වෙනසක් සිදුවේදැයි පැහැදිලි කරන්න.

(II) A මිශ්‍රණයේ තවත් 100 $cm^3$ ක් වෙන්කරගෙන එයට 0.2 $moldm^{-3}$ වන $Mg(NO_3)_2$ ජලීය ද්‍රාවණයකින් 100 $cm^3$ ක් එක්කරයි. $K_{SP}(Mg(OH)_2) = 2\times10^{-12}$ $mol^3dm^{-9}$ .

i. එහිදී $Mg(OH)_2$ අවක්ෂේපයක් සෑදෙන බව ගණනයක් මගින් දක්වන්න.

ii. අවක්ෂේපයක් සෑදීම සිදුනොවීමට නම් ඉහත II හි පිළියෙල කරගත් මිශ්‍රණය 200 $cm^3$ ට එකතු කළ යුතු අවම $NH_4Cl$ ස්කන්ධය සොයන්න. (N=14, H=1. Cl = 35.5, Na = 23)

b) A හා B එකිනෙක මිශ්‍ර වෙමින් සාදන පරිපූර්ණ ද්‍රාවණය රවුල් නියමය පිළිපදියි. 40$C^0$ දී A හා B ගෙන් සමන්විත පරිපූර්ණ ද්‍රාවණයක, ද්‍රව කලාපය එහි වාෂ්පය සමග සමතුලිතව පවතී. ද්‍රව කලාපයේ A හි මවුල භාගය 0.3 ක් වේ. A හා B ගේ සංශුද්ධ වාෂ්ප පීඩන පිළිවෙලින් $6 \times 10^4$ Pa හා $4 \times 10^4$ Pa වේ.

i. පරිපූර්ණ ද්‍රාවණයක ලක්ෂණ 02 ක් දෙන්න .

ii. වාෂ්ප කලාපයේ A හා B ගේ ආංශික පීඩන සොයන්න .

iii. වාෂ්ප කලාපයේ A හා B ගේ මවුල භාග සොයන්න

iv. වාෂ්ප කලාපයේ මුළු පීඩනය සොයන්න .

v. මිශ්‍රණය සඳහා වාෂ්ප පීඩනය සංයුති ප්‍රස්ථාරය ඇද, එහි A හා B ගේ ආංශික පීඩන,වාෂ්ප කලාපයේ මුළු පීඩනය, ද්‍රව කලාපයේ A හා B හි මවුල භාග ලකුණු කරන්න.

07) a (I) i. පහත දක්වා ඇති ඉලෙක්ට්‍රෝඩ 04 න් සුදුසුම ඉලෙක්ට්‍රෝඩ 02 ක් පමණක් භාවිත කර වැඩිම විද්‍යුත් ගාමක බලය ලබාගත හැකි විද්‍යුත් රසායනික කෝෂය ඇද එහි සියලු කොටස් නම් කරන්න.

$Mg^{2+}_{(aq)} + 2e \rightleftharpoons Mg_{(s)}$ - 2.36. V

$2H_2O(l) + 2e \rightleftharpoons H_2(g) + 2OH^-_{(aq)}$ - 0.83 V

$Zn^{2+}(aq) + 2e \rightleftharpoons Zn_{(s)}$ - 0.76. V

$2H^+(aq) + e \rightleftharpoons H_2(g)$ 0.00 V

23' AL API [ PAPERS GROUP ]

CamScanner

ii. ඇනෝඩයේ හා කැතෝඩයේ ප්‍රතික්‍රියා ලියා දක්වන්න

iii. සමස්ත කෝෂ ප්‍රතික්‍රියාව දක්වන්න.


iv. කෝෂය IUPAC අංකනයට අනුව දක්වන්න .

v. කෝෂයේ විද්‍යුත් ගාමක බලය සොයන්න .

vi. ලවණ සේතුවේ වැදගත්කම 02 ක් දක්වන්න

vii. කෝෂයේ විද්‍යුත් ගාමක බලය වැඩි කර ගැනීමට උෂ්ණත්වය හා සාන්ද්‍රණය වෙනස් කළ යුතු ආකාරය පැහැදිලි කරන්න .

II) විද්‍යුත් රසායනික කෝෂ පිළිබඳ මූලධර්ම උපයෝගී කරගෙන සාදාගත් ලෙක්ලාන්ච් කෝෂයක රූප සටහනක් මෙහි දක්වා ඇත




i. මෙම කෝෂය ප්‍රාථමිකද ද්විතියිකද යන්න සඳහන් කර ඔබේ පිළිතුරට හේතුව ලියන්න.

ii. මෙහි විද්‍යුත් විච්ඡේද්‍යය නම් කර ධන හා සෘණ අග්‍ර සඳහා යොදාගන්නා ද්‍රව්‍ය නම් කරන්න ?

iii. කැතෝඩ හා ඇනෝඩ ප්‍රතික්‍රියා ලියා දක්වන්න.

iv. සමස්ත කෝෂ ප්‍රතික්‍රියාව ලියා දක්වන්න.

III) විද්‍යුත් ලෝහාලේපනය මගින් පැත්තක දිග 2 cm වන ඝනකයක ඒකාකාරී ලෙස h ඝනකමක් සහිතව රන් ආලේපනය කිරීමට සැලසුම් කර ඇත .ඇනෝඩය ලෙස රන් තහඩුවක් ද (Au) කැතෝඩය ලෙස ඝනකයක් ද ගෙන, විද්‍යුත් විච්ඡේද්‍යය ලෙස $Au(CN)_3/KCN$ භාවිත කර 1.2 A නියත ධාරාවක් පැය 01 මිනිත්තු 20 ක් තුළ යවන ලදී . (Au = 197, Au වල ඝනත්වය 19.3 $gcm^{-3}$ , F = 96500 C $mol^{-1}$)

i. එම කාලය තුල යැවූ විද්‍යුත් ප්‍රමාණය කුලෝම් වලින් ගණනය කරන්න.


ii. කැතෝඩයේ රන් ආලේප වීමට අදාළ තුලිත අයනික ප්‍රතික්‍රියාව ලියන්න.

iii. මෙම ක්‍රියාවලියේදී තැන්පත් වූ රන් (Au) ස්කන්ධය ගණනය කරන්න .

iv. රන් (Au) ආලේප කිරීමෙන් පසු ඝනකයේ නව පරිමාව ගණනය කරන්න .

23' AL API [ PAPERS GROUP ]

(b) පහත ගැලීම් සටහන ආධාරයෙන් අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු ලබාදෙන්න.




23' AL API [ PAPERS

I.පහත වගුව පිටපත් කරගෙන හිස්තැන් සම්පූර්ණ කරන්න

| සංඝටකය | රසායනික සූත්‍රය | IUPAC නාමය | වර්ණය |
|---|---|---|---|
| $A^{2+}$ ජලීය ද්‍රාවණය | | | |
| B අවක්ෂේපය | | | |
| C ද්‍රාවණය | | | කහ |
| D ද්‍රාවණය | | | කහ/ දුඹුරු |
| E ද්‍රාවණය | | | |
| F අවක්ෂේපය | | | කහ |
| G ස්ඵටික | | | |
| X වායුව | | | |

II.

i. $A^{2+}$ කැටායනයට අදාල ඉලෙක්ට්‍රොනික වින්‍යාසය ලියන්න.

ii. d ගොනුවේ මූලද්‍රව්‍ය ඇතුලත් රසායනික ද්‍රව්‍ය උත්ප්‍රේරක ලෙස කර්මාන්ත රසායනයේදී භාවිතා කරයි. එසේ භාවිතා කරන අවස්ථා පෙන්වීමට රසායනික ප්‍රතික්‍රියා 3ක් අදාළ උත්ප්‍රේරක සමඟ ලියා දක්වන්න.


iii.

CamScanner

8. (ii) I. එකම ආරම්භක කාබනික සංයෝගය ලෙස $CH_3CH_2C\equiv CH$ භාවිතා කරමින් පහත පියවර වලින් පමණක් G සංයෝගය සංස්ලේෂණය කිරීම සඳහා ප්‍රතික්‍රියා අනුක්‍රමයක් පහත දී ඇත. පියවර 1-7 සඳහා සුදුසු ප්‍රතිකාරක, ලැයිස්තුවේ දී ඇති ඒවායින් පමණක් තෝරාගෙන මෙම ප්‍රතික්‍රියා අනුක්‍රමය සම්පූර්ණ කළ යුතුවේ.මේ සඳහා

i. A,B,C,D,E, හා F සංයෝග වල ව්‍යුහ අඳින්න.


ii පියවර I සිට 07 දක්වා සුදුසු ප්‍රතිකාරක ලියා දක්වන්න.




ප්‍රතිකාරක ලැයිස්තුව : $H_2$, $NaNH_2$, $PBr_3$, $HgSO_4$, තනුක $H_2SO_4$, $NaBH_4$, $Al_2O_3$, $CH_3OH$


II. පහත දැක්වෙන ප්‍රතික්‍රියා ශ්‍රේණිය P, Q, R ව්‍යුහ ඇඳීමෙන් හා සුදුසු a, b, c,d හා e යන ප්‍රතිකාරක දක්වමින් සම්පූර්ණ කරන්න.

23' AL API [ PAPERS GRO




b පියවර හතරකට නොවැඩි සංඛ්‍යාවකින් පහත දැක්වෙන පරිවර්තන සිදුකරන්නේ කෙසේදැයි පෙන්වන්න.


I.




II.



ට. පහත සඳහන් ප්‍රතික්‍රියා අනුක්‍රමය සලකන්න.




i. 1 හා 2 ප්‍රතික්‍රියාවලට අදාල ප්‍රතිකාරක හා උත්ප්‍රේරක ලියන්න.

ii. 1 හා 2 ප්‍රතික්‍රියාවලට අදාල යාන්ත්‍රණ වෙන වෙනම ලියන්න.

9.(a) P නම් ජලීය ද්‍රාවණයක් ගෙන එයට තනුක HCl එකතුකළ විට තනුක $NH_3$ තුළ දියවන A නම් සුදු අවක්ෂේපය ලැබුණි. එම අවක්ෂේපය පෙරා පෙරණයට C නම් වායුව බුබුලනය කිරීමේදී B නම් කළු අවක්ෂේපයක් ලැබුණි. B ට තනුක HCl එකතු කළ විට එම අවක්ෂේපය දියවූ අතර ලා නිල්පැහැ ද්‍රාවණයක් හා C වායුව නැවත සෑදුණි. එම ලා නිල් ද්‍රාවණය ජලීය $NH_3$ සමඟ තද නිල් පැහැ විය. C වයුව D නම් ජලීය ද්‍රාවණය තුලින් යැවූ විට E නම් කළු අවක්ෂේපයක් ලැබුණි. D ද්‍රාවණයට F නම් ලවණ ද්‍රාවණය එක්කල විට G නම් සුදු අවක්ෂේපයක් ලැබුණු අතර එම අවක්ෂේපය උණු ජලයෙහි දියවී සිසිල් වීමේදී නැවත අවක්ෂේප විය. F ද්‍රාවණය පහන්සිළු පරික්ෂාවේදී කහ දැල්ලක් ලබාදේ.

D ද්‍රාවණයට Al හා NaOH දමා රත්කළ විට පිටවන H නැමති අවර්ණ වායුව සාන්ද්‍ර HCl සමඟ සුදු දුමාරයක් ලබාදුනි. D ද්‍රාවණයට $Na_2S_2O_3$එක්කළ විට I නැමති සුදු අවක්ෂේපය ලැබෙන අතර එය රත් කිරීමේදී E නම් අවක්ෂේපය ලැබේ. D ද්‍රාවණයට තනුක අම්ලයක් එකතුකළ විට වායුවක් පිට නොවේ. F හා D ද්‍රාවණ තුල දියවී ඇත්තේ එක් ලවණය බැගිනි.

i. A සිට I දක්වා රසායනික සංයෝග හඳුනාගන්න. (රසායනික සූත්‍ර ලිවිය යුතුයි)

ii. පහත ප්‍රතික්‍රියා සඳහා තුලිත රසායනික සමීකරණ ලියන්න.

1. B + ත. HCl
2. C+D
3. D + F
4. H + සා. HCl

iii. ඉහත C වායුව තනුක $H_2SO_4$ ඇති විටදී $K_2Cr_2O_7$ සමඟ සිදුකරන ප්‍රතික්‍රියාව සඳහා තුලිත රසායනික සමීකරණය ලියන්න.

23' AL API [ PAPERS GROU

(b) $Mg(NO_2)_2$ , $MgSO_4$, MgO හා නිෂ්ක්‍රිය ද්‍රව්‍යයක් පමණක් අඩංගු මැග්නීසියම් ප්‍රතිකාරකයක 12 g ක් ජලයේ දියකර 250 $cm^3$ ක ජලීය ද්‍රාවණයක් පිළියෙල කරගනී. ලැබෙන ජලීය ද්‍රාවණය (X) පදනම් කර පහත පරීක්ෂණ සිදුකරන ලදී. ( Ba - 137, Mg -24, N-14, O-16, S-32)

- X ජලීය ද්‍රාවණයෙන් 25 $cm^3$ ක් ගෙන එයට HCl ස්වල්පයක් එකතු කර පසුව 0.15 $moldm^{-3}$ $KMnO_4$ 20 $cm^3$. ක් එකතු කරයි. ප්‍රතික්‍රියාව අවසානයේදී ලැබුණු මිශ්‍රණය සමඟ අනුමාපනය කිරීමට 0.125 $moldm^{-3}$ වන $FeCl_2$ ජලීය ද්‍රාවණයකින් 40.00 $cm^3$ක් වැයවිය. ($OH^-$ , $Cl^-$ ඔක්සිකරණය නොවන බව උපකල්පනය කරන්න)
- X ජලීය ද්‍රාවණයෙන් තවත් 25 $cm^3$ ක් ගෙන එයට වැඩිපුර $BaCl_2$ එකතු කරයි. ලැබුණු සුදු පැහැති අවක්ෂේපය පෙරා වියළාගනී. එවිට 466 mg ක ස්කන්ධයක් ලැබුණි.

- ඉහත x ජලීය ද්‍රාවණයෙන් 25 $cm^3$ ගෙන එයට $H_2SO_4$ 25 $cm^3$ක් එකතු කරයි.ලැබුණු අවසාන ද්‍රාවණයේ $Mg^{2+}$. සංයුතිය 4800 pm ලෙස සොයාගෙන තිබෙයි.

i. x ජලීය ද්‍රාවණය පිළියෙල කරගැනීමෙන් අනතුරුව සිදුකරන සියලු පියවර වලට අදාල තුලිත රසායනික ප්‍රතික්‍රියා ලියන්න.

ii. $Mg(NO_2)_2$ හා $MgSO_4$ හා MgO වල ස්කන්ධ ප්‍රතිශත ලියන්න.

iii. $Mg^{2+}$ අයන ගුණාත්මක හඳුනාගැනීම සඳහා පරීක්ෂණයක් හා එහි නිරීක්ෂණ ලියන්න.

iv. Mg ලෝහයේ භාවිතා 2ක් ලියන්න.

10. (a) රසායනික කර්මාන්ත සම්බන්ධයෙන් පහත වගුවට අදාලව අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

| නිෂ්පාදන ක්‍රියාවලිය | කර්මාන්තය | ක්‍රියාවලිය | අමුද්‍රව්‍ය | අතුරුඵල |
|---|---|---|---|---|
| I | A | ඩව් ක්‍රමය | බිටර්න්/බ්‍රයින් ද්‍රාවණ<br>B | C |
| II | D | පටල කෝෂ ක්‍රමය | E<br>ජලය | F , $Cl_2$ |
| III | G | උණුසුම් ක්‍රියාවලිය | H<br>NaOH | I |
| IV | J | K | බ්‍රයින් ද්‍රාවණ<br>ඇමෝනියා<br>L | $CaCl_2$ |
| V | $T_1O_2$ නිෂ්පාදනය | M | ඉල්මනයිට්/<br>රූටයිල්<br>N | O |

i. A සිට O දක්වා අදාල කර්මාන්තය, ක්‍රියාවලිය, අමුද්‍රව්‍ය, හා අතුරුඵල හඳුනාගන්න.

ii. ඉහත I හා II කර්මාන්ත වලදී සිදුකරන විද්‍යුත් විච්ඡේදන ක්‍රියාවලියේදී සිදුවන ඇනෝඩ හා කැතෝඩ ප්‍රතික්‍රියා වෙන වෙනම ලියන්න.

iii. I නිෂ්පාදන ක්‍රියාවලියේදී විද්‍යුත් විච්ඡේදන කෝෂය තුල උෂ්ණත්වය 700 – 800 $^0C$ හි පරාසයක පවත්වා ගැනීමේ වැදගත්කම කෙටියෙන් පැහැදිලි කරන්න.

iv. II වන කර්මාන්තයේ දී නිෂ්පාදිත ඵලයේ ප්‍රයෝජන දෙකක් ලියන්න.

v. V වන කර්මාන්තයේ ප්‍රධාන පියවර දෙක නම් කරන්න.

vi. IV වන නිෂ්පාදනය ආශ්‍රිතව දැක්වෙන ප්‍රධාන රසායනික ප්‍රක්‍රියා 4 ලියන්න.

23' AL API [ PAPERS GROUP



CS CamScanner


b. පහත ගැලීම් සටහනේ දක්වා ඇත්තේ වායු දූෂක මූලික වී රසායනික ක්‍රියාදාමයකට පසු සිදුවන වායුගෝලීය තත්ව/ ක්‍රියාවලි 5කි.

◯ - වායු දූෂක සංයෝග. ▭ - වායුගෝලීය ක්‍රියාවලිය

සැ.යු. මෙහි 1-5 දක්වා ක්‍රියාවලි සඳහා දායක වන වායු දූෂක A-G දක්වා පෙන්නුම් කර ඇත. නමුත් මෙම වායු දූෂක එකිනෙක සමඟ රසායන්කව ප්‍රතික්‍රියා කර අදාළ ක්‍රියාවලිය සිදුවන බව මෙහිදී අදහස් නොකෙරේ.

උදා:- G හා B එකිනෙක රසායනිකව ප්‍රතික්‍රියා කර 1 වන ක්‍රියාවලිය සිදු නොවන අතර G හා B දායක වීමෙන් පමණක් එම ක්‍රියාවලිය සිදුවේ.

23' AL API [ PAPERS GROUP




i. ඉහත 1 සිට 5 දක්වා ක්‍රියාවලි හඳුනාගන්න.

ii. A-G දක්වා වායු දූෂක/ සංයෝග ලියා දක්වන්න.

iii. 2 ක්‍රියාවලිය සිදුවන ආකාරය තුලින රසායනික සමීකරණයක් මගින් පෙන්වන්න.

iv. ඉහත 3 ක්‍රියාවලිය සඳහා දායක වන නයිට්‍රජන් අඩංගු එක් රසායනික සංයෝගයක් නම් කරන්න.

v. 1 ක්‍රියාවලියට අදාල අහිතකර බලපෑම් දෙකක් සඳහන් කරන්න.

vi. 3 වන ක්‍රියාවලිය සඳහා සහභාගී වන වායුන්ගේ පොදු ප්‍රධාන ලක්ෂණ දෙකක් ලියන්න.



CS CamScanner

23, AL API
PAPERS GROUP
The best group in the telegram